ජගත් ප්‍රවණතා

# උද්ඝෝෂකයන් ගේ අලුත් ම සටන් පාඨය 'ගෝලීයකරණය'

උද්ඝෝෂකයනට හොඳ සටන් පාඨ අවශ්‍යය යි. ඇතැම්විට හොඳ සටන් පාඨ ඉල්ලීම් තරමට ම ඔවුනට වැදගත් ය. හොඳ සටන් පාඨයක් නැතිව උද්ඝෝෂණ ඉදිරියට ඇදගෙන යාම ඔවුනට දුෂ්කර ය. අධිරාජ්‍යවාද විරෝධී සටන් පාඨ පසුගිය සියවස මැද භාගයේ ලොව පුරා උද්ඝෝෂකයන් අතර ප්‍රචලිතව පැවතිණි. ඉන් පසුව ජනප්‍රිය වූයේ ධනවාදයට විරෝධය පෑමේ සටන් පාඨ ය. උද්ඝෝෂකයන් ගේ අද මෝස්තරය වී ඇත්තේ ගෝලීකරණයට විරුද්ධ සටන් පාඨ කීමයි.

ගෝලීයකරණයට බොහෝ දෙනා විරුද්ධ වන නමුත් එය හරිහැටි අවබෝධ කර ගෙන ඇත්තේ ටික දෙනෙකි. බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් සරසවියේ මහාචාර්යවරයකු වූ ඩේවිඩ් හාව් ගෝලීයකරණය හඳුන්වා දෙන්නේ 'ධනවාදයේ වර්ධනයේ අලුත් ම අවස්ථාව' ලෙසිනි. ලෙනින් අද ජීවත්ව සිට ගෝලීයකරණය ගැන අදහසක් දැක්වූයේ නම් ඔහු ඉතා සරල ලෙස ගෝලීයකරණය ධනවාදයේ වර්ධනය යැයි සටන් කරනු ඇතැයි කැනඩාවේ ටොරන්ටෝ සරසවියේ භූගෝලවිද්‍යා අංශයේ මහාචාර්ය කණිෂ්ක ගුණවර්ධන පවසයි. ගෝලීයකරණයට ධනවාදය සමඟ ඇති ගනුදෙනුව කුමක්දැයි විමසිලිවත් වීමේ දී දිය හැකි පිළිතුර වන්නේ ධනවාදය විශ්වකරණය වීම යන්නයැයි ඔහු කිය යි.

ගෝලීයකරණයට ද වෙනත් ආර්ථික දර්ශනයනට මෙන් ම දිගු ඉතිහාසයක් ඇත. ගෝලීයකරණය වසර දහස් ගණනක් පැරණි සංකල්පයකි. එහෙත් ගෝලීයකරණය ව්‍යවහාරික පදයක් ලෙස භාවිතයට ගැනුණේ මෑතක සිට යි.

ගෝලීයකරණය යනුවෙන් අදහස් කරන්නේ ජනයා, භාණ්ඩ, මුදල් සහ තොරතුරු දේශසීමා බාධකවලින් තොරව රටවල් අතර හුවමාරු වීම යි. මෙම ක්‍රියාවලිය අද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතියි. තම දේශසීමාව තුළ ක්‍රියාත්මක විය යුත්තේ කුමන වෙළෙඳ සමාගම දැයි අද කිසියම් රටක ආණ්ඩුව විසින් තීරණය කරනු නොලැබේ. තමන්ට ව්‍යාපාරික කටයුතුවල යෙදීමට සුදුසු ම රට කුමක්දැයි අද තීරණය කරනු ලබන්නේ එම රටෙහි ව්‍යාපාරික කටයුතුවල යෙදීමට යන වෙළෙඳ සමාගම විසිනි. මේ නිසා විදේශීය වෙළෙඳ සමාගම් තම රටවලට ගෙන්වා ගැනීම සඳහා හොඳම ව්‍යාපාරික පරිසරයක් බිහි කිරීම පිණිස විවිධ රටවල් ලොකු තරගයක යෙදී සිටියි. එක් එක් රටවල් සතු සම්පත් මොනවාදැයි සොයා බලවාට වඩා අද සිදුවන්නේ එම සම්පත් මඟින් නව වටිනාකම් බිහිකර ගන්නේ කෙසේදැයි සොයා බැලීම ය. මෙහිදී වැඩි අවධානයක් යොමුවන්නේ බුද්ධිය සහ නව තාක්ෂණ ඥානය යොදා ගෙන වැඩි වටිනාකම් (භාණ්ඩ සහ සේවා) නිෂ්පාදනය කිරීමයි.

බුද්ධිමය වටිනාකම් නිර්මාණය කළ හැක්කේ ජනතාවටයි. එම වටිනාකම් කාර්යක්ෂම ලෙස අලෙවි කළ හැකි නම්‍යශීලී වෙළෙඳ පොළවල් තිබිය යුතු ය. මේ සඳහා වෙළෙඳම සහ ආයෝජනය ලිහිල් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. රටක් තුළ දේශීය වශයෙන් නීති රීති ලිහිල් කිරීමත් ව්‍යූහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් අවශ්‍ය යි.

> *ගෝලීයකරණ ව්‍යාපාරයට විරුද්ධ පිරිසක් ද ලොව පුරා වෙසෙයි. හොඳින් සංවිධානය වී සිටින මෙම පිරිසට සැහෙන උස් හඬක් නැඟිය හැකි ය. ඔවුහු ගෝලීයකරණයට විකල්පයක් ඉදිරිපත් කිරීමට උත්සහ දරති. ඇතැම් අය මෙම විකල්පය ප්‍රතිගෝලීයකරණය ලෙස හඳුන්වති.*

ගෝලීයකරණය තුළින් සංවර්ධනය වූ රටවල, විශේෂයෙන් ඇමරිකාවේ වටිනාකම් සහ සංස්කෘතිය අනෙක් රටවල් මත පැටවීමට උත්සාහ දරන බවට මතයක් පැතිර ගොස් ඇත. එය එසේ නොවන බව 'ටයිම්' ප්‍රවෘත්ති සඟරාවට 'ග්ලෝබල් ඇජෙන්ඩා' හෙවත් ගෝලීය න්‍යාය පත්‍රය යන තීරු ලිපිය ලියන මයිකල් එලියට් නමැති ලේඛකයා පවසයි. හැම දෙනා ගේ ම වැඩ කටයුතු කරන ආකාරය ගෝලීයකරණය මඟින් වෙනස් වන බව ඔහු කිය යි.

මේ අතර ගෝලීයකරණ ව්‍යාපාරයට විරුද්ධ පිරිසක් ද ලොව පුරා වෙසෙයි. හොඳින් සංවිධානය වී සිටින මෙම පිරිසට සැහෙන උස් හඬක් නැඟිය හැකි ය. ඔවුහු ගෝලීයකරණයට විකල්පයක් ඉදිරිපත් කිරීමට උත්සහ දරති. ඇතැම් අය මෙම විකල්පය ප්‍රතිගෝලීයකරණය ලෙස හඳුන්වති. මෙය කිසියම් ප්‍රදේශයකට අවශ්‍ය භාණ්ඩ සහ සේවා එම ප්‍රදේශය තුළ ප්‍රදේශයේ ආයතන මඟින් නිෂ්පාදයනය කර අලෙවි කිරීම ම නොවේ. ඒ වෙනුවට ප්‍රතිගෝලීයකරණය තුළින් සිදු විය යුත්තේ දුර්වල ආර්ථිකයනට වඩාත් තරගකාරී විය හැකි පරිදි හැම කොටසකට ම ඵල ප්‍රයෝජන ලැබෙන අයුරින් ගෝලීය වෙළෙඳ පොළ ලිහිල් කිරීම ය. ඒ මඟින් රජයේ අවම මැදිහත්වීමකින් සහ සමාජීය පාලනයකින් තොරව ආර්ථිකයේ හැම අංශයක් ම සමාන ලෙස වර්ධනය වීමට ඉඩ දිය හැකි ය.

එහෙත් මෙම අදහසට ගෝලීයකරණ ක්‍රියාවලියට පක්ෂපාත අය කැමැති නැත. අන්තර්ජාතික වෙළෙඳ පොළ හසුරුවන්නන් දුප්පත් රටවලට හිතවත් අයුරින් කටයුතු කරන බවක් පෙන්වන්නේ ද නැත. දුප්පත් සහ පොහොසත් රටවල් අතර ඇති ආදායම් පරතරය පළල් වී යැමෙන් සහ ශීඝ්‍ර පාරිසරික විනාශයන්ගෙනුත් ඒ බව ප්‍රදර්ශනය කෙරෙතියි විචාරකයෝ පවසති. ගෝලීයකරණය මඟින් වැඩි වාසි ලැබෙන්නේ ලොව වඩාත් ශක්තිමත් වඩාත් බලවත් රටවලට යැයි එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළේ 1997 මානව සංවර්ධන වාර්තාව පෙන්වා දී ඇත. අසමාන තත්ත්වයන් යටතේ සංවර්ධනය වන රටවල් අන්තර්ජාතික වෙළෙඳ පොළට පිවිසීම මගින් එම රටවලට සිදු වූ සිදු වී ඇති පාඩුව ඩොලර් කෝටි පනස් දහසක් පමණ වෙතැයි එම වාර්තාව කිය යි.

ගෝලීයකරණය සම්බන්ධයෙන් පිළිගත යුතු සත්‍යයක් ඇත. එනම් අප කැමැති වුවත් අකමැති වුවත් ගෝලීයකරණය ඉදිරියටත් පවතිනු ඇති බව යි. අපට එම යථාර්ථය වෙනස් කළ නොහැකි ය. ධනවාදය ලෝකයෙන් අතුගා දැමීමට කොමියුනිස්ට්වාදීහු අවුරුදු 70 කට වැඩි කාලයක් උත්සාහ දැරූහ. එහෙත් අන්තිමට අතු ගෑවී ගියේ කොමියුනිස්ට්වාදීන් ම ය.

එසේනම් කළ යුත්තේ කුමක් ද? ගෝලීයකරණයට එක්වීමේ දී වෙළෙඳ පොළ තොරතුරු වෙළෙඳ පොළ විනිවිදභාවය, වෙළෙඳ පොළ නීතිරීති සහ වෙළෙඳ පොළ ව්‍යූහය ප්‍රතිසංස්කරණය වැනි අත්‍යවශ්‍ය අංශවලින් අප වැනි දියුණු වන රටවලට උපරිම වාසි



සැලැසෙන අයුරින් අන්තර්ජාතික ගිවිසුම්වලට එළැඹීම යි.

ගෝලීයකරණය ගැන මෙතරම් දීර්ඝ ලෙස අදහස් දැක්වීමට සිදුවූයේ ලොව පුරා විසිරී සිටින උද්ඝෝෂකයන් ගේ අද ජනප්‍රිය සටන් පාඨය වී ඇත්තේ ගෝලීයකරණය බැවිනි. ලොව පුරා රටවල් රැසක පෙළපාලිකරුවෝ මේ වසරේ මැයි දිනය ගෝලීයකරණයට විරෝධය පළ කිරීමට යොදා ගත්හ. ඕස්ට්‍රේලියාවේ සිඩ්නි, මෙල්බර්න්, බ්‍රිස්බේන් වැනි ප්‍රධාන නගරවල මැයි පෙළපාලිකරුවෝ ගෝලීයකරණයට විරෝධය පළ කරමින් කොටස් වෙළෙඳපොළ ගොඩනැගිලිවලට ඇතුළුවීම අවහිර කළහ. දේශපාලනඥයන්ගේ පඹයින් පිළිස්සූහ.

ගෝලීයකරණයට විරුද්ධ මැයි දින පෙළපාලි පැරිස්, ලන්ඩන්, වෝර්සෝ, ගුවාතමාලා, ලා පෙස් වැනි ලොව තවත් නගර රැසක ද පැවැත් විණි. ගෝලීයකරණයට විරුද්ධ උද්ඝෝෂණ මෙතරම් වේගවත් වූයේ ඇමරිකාවේ සියැටල් නුවර දී ලෝක වෙළෙඳ සංවිධානයේ (ඩබ්ලිව්. ටී. ඕ.) රාජ්‍ය නායක සමුළුවට විරුද්ධව උද්ඝෝෂකයෝ 1999 දෙසැම්බර් මාසයේ දී දැවැන්ත පෙළපාලියක් සංවිධානය කිරීමෙන් අනතුරුව යි. එම සමුළුවට සහභාගිවීමට ගිය ඇමරිකාවේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්ට සමුළු ශාලාවට යැමට උද්ඝෝෂකයෝ ඉඩ නුදුන්හ. (නවයුගය 2000 පෙබරවාරි)

ඉන් පසුව නිදහස් වෙළෙඳම, අන්තර්ජාතික වෙළෙඳ සංවිධාන පිහිටුවා ගැනීම සහ වෙළෙඳම පිළිබඳව ජාතීන් අතර පොදු ගිවිසුම්වලට එළැඹීම වැනි අවස්ථා වෙනුවෙන් පැවැති සමුළු සහ රැස්වීම්වලට බාධා පැමිණවීමට උද්ඝෝෂකයෝ පියවර ගත්හ. සියැටල් සමුළුවෙන් පසුව එවැනි රැස්වීම් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් වෙක් සමූහාණ්ඩුවේ ප්‍රාග්, ප්‍රංශයේ නයිස් ස්විට්සර්ලන්තයේ දවෝස් යන නගරවල පැවැත්විණි.

ලොව විශාලතම නිදහස් වෙළෙඳ පොළ වන 2005 දී ක්‍රියාත්මක වන ඇමරිකා නිදහස් වෙළෙඳ පොළ පිහිටුවා ගැනීම පිණිස කැනඩාවේ ක්විබෙක් නගරයේ පසුගියදා පැවැති ඇමරිකාවේ රටවල් 34 ක රාජ්‍ය නායකයන් සහභාගි වූ සමුළුව ගෝලීයකරණ ව්‍යාපාරයට විරුද්ධ පෙළපාලිකරුවන් ගෙන් තදින් බාධා එල්ල විය. මෙහිදී ඇති වූ කලබලවලින් පොලිස් නිලධාරීන් 34 දෙනකු ඇතුළු 79 දෙනකු තුවාල ලැබී ය.

*ගෝලීයකරණය ගැන මෙතරම් දීර්ඝ ලෙස අදහස් දැක්වීමට සිදුවූයේ ලොව පුරා විසිරී සිටින උද්ඝෝෂකයන් ගේ අද ජනප්‍රිය සටන් පාඨය වී ඇත්තේ ගෝලීයකරණය බැවිනි. ලොව පුරා රටවල් රැසක පෙළපාලිකරුවෝ මේ වසරේ මැයි දිනය ගෝලීයකරණයට විරෝධය පළ කිරීමට යොදා ගත්හ.*

ඇමරිකා නිදහස් වෙළෙඳ පොළට උතුරු ඇමරිකාවේ කැනඩාවේ සිට දකුණු ඇමරිකාවේ චිලිය දක්වා ඇති සියලු රටවල් (කියුබාව හැර) ඇතුළත් වෙයි.

මෙම රටවල කෝටි අසූවක ජනගහනයක් වෙසෙන අතර ආර්ථික නිෂ්පාදනය කෝටි 1,100 කි. ඇමරිකා මහද්වීපයේ දිළින්දන් සහ පොහොසතුන් අතර ආදායම් පරතරය අඩු කර සියලු දෙනාගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඇමරිකා නිදහස් වෙළෙඳ පොළ පිහිටුවා ගත් බව ක්විබෙක් සමුළුවට සහභාගි වූ රාජ්‍ය නායකයෝ කීහ.

එහෙත් ගෝලීයකරණයට විරුද්ධ පිරිස් කියා සිටියේ එම වෙළෙඳ පොළ පිහිටුවීම මගින් ලොකු ව්‍යාපාරිකයනට වාසි සැලැසෙන අතර දිළින්දන්ට හිරිහැර වන බව යි.

මේ අතර එම නගරයට පැමිණ සාමකාමී ලෙස සමුළු ශාලාව ඉදිරියට ගිය සිසුන් පරිසර හිතකාමීන්, ගොවියන් සහ විශ්‍රාමිකයන් ගෙන් සැදි 30,000 ක පමණ පිරිසක් ඉල්ලා සිටියේ වෙළෙඳ ප්‍රශ්නවලට කලින් සමාජ ප්‍රශ්නවලට මුල්තැන දෙන ලෙස යි.

'ටයිම්' සඟරාවට 'ග්ලෝබල් ඇජෙන්ඩා' තීරු ලිපිය ලියන මයිකල් එලියට් මෙම ප්‍රශ්නය ගැන දක්වන අදහස සැලකිල්ලට ගැනීම වැදගත් ය.

ගෝලීය ක්‍රමය ක්‍රියාත්මක කෙරෙක යන්ත්‍රණය වන ලෝක වෙළෙඳම දිළින්දන්ට විරුද්ධව ක්‍රියාත්මක කෙරෙන කුමන්ත්‍රණයක් නොවේ. දිළිඳු බවේ යදම් කඩා ගෙන ගැලවී යාමට ඇති හොඳම ක්‍රමය ගෝලීය ආර්ථික රටාවට එක්වීමයි. කටවල් බොහොමයක් ගෝලීයකරණය වීම වැඩිකමෙන් නොව ගෝලීයකරණයවීම අඩුකමෙන් පීඩා විඳියි. පොහොසත් රටවල උද්ඝෝෂකයන් එය නොදන්නවා විය හැකි ය. සංවර්ධනය වූ රටවලට භාණ්ඩ විකුණා සංවර්ධනය වන රටවල ශ්‍රමිකයන් තම ජීවිතය යහපත් කර ගනිති.

සංවර්ධනය වන රටවල භාණ්ඩ සංවර්ධනය වූ රටවලට ඒම සංවර්ධනය වූ රටවල එවැනි භාණ්ඩ නිපදවන ශ්‍රමිකයනට තර්ජනයකි. එබැවින් පිටින් එල්ලවන තරගයෙන් තම රැකියා ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන බටහිර රටවල උද්ඝෝෂකයෝ ආත්මාර්ථකාමී ලෙස කටයුතු කරති. මෙම පිරිස් උද්ඝෝෂණ කිරීමට පෙළැඹී ඇත්තේ නොමග යාමෙනි.

එලියට් සඳහන් කරන එම පිරිසට අමතරව තවත් පිරිසක් නැත. ඔවුන් ඉදිරිපත් කෙරෙන ඕනෑම දෙයකට විරුද්ධ ය.

පිළිගත් පැවැත්ම පිළිගත් සම්ප්‍රදාය සිඳ බිඳ විනාශකර දැමීම ඔවුන් ගේ අරමුණ ය. එවැනි කොටස් ඕනෑම පෙළපාළියකට උද්ඝෝෂණයකට එක් වෙයි. ආරක්ෂක නිලධාරීන් සමග ගැටී කලහ ඇති කර ගන්නේත් රථ වාහන සහ ගොඩනැගිලිවලට අලාභ හානි සිදු කරන්නේත් ඔවුන් ය.

විසඳ ගත යුතු ප්‍රශ්න වටා නොව සටන් පාඨ වටා රැස්වන පිරිස් ඔවුන් ය.

කිසියම් සාධාරණ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පෙළපාළියක් යැමට හෝ උද්ඝෝෂණයක් පැවැත්වීමට හෝ සූදනම් වන පිරිස් පරිස්සම් විය යුත්තේ තම උද්ඝෝෂණය බලෙන් ඩැහැගෙන එය කලබලයක් බවට පත් කිරීමට සැරසෙන ඉහත කී කොටස් වලිනි.

❑